සැ. යු. - 2021.09.17 වැනි දින පළවූ අංක 2246 දරන ගැසට් පත්‍රයේ III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,247 - 2021 සැප්තැම්බර් 24 වැනි සිකුරාදා - 2021.09.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1242 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | 1251 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 1251 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | — |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 ඔක්තෝබර් මස 15 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2021 ඔක්තෝබර් මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය.''

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents. gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2021 අංක 684

MOD/DEF/HRM/02/R/RET/20 (175-177).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක්, විශ්‍රාම ගැනීමක් සහ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2019 ඔක්තෝබර් මස 29 වැනි දින සිට මේජර් ජෙනරාල් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් ජෙනරාල් කෝදාගොඩ හේවගේ පාලිත ප්‍රසන්න ප්‍රනාන්දු ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ (නි/60649)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2020 සැප්තැම්බර් මස 26 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජෙනරාල් කෝදාගොඩ හේවගේ පාලිත ප්‍රසන්න ප්‍රනාන්දු ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ (නි/60649)

**නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2020 සැප්තැම්බර් මස 26 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජෙනරාල් කෝදාගොඩ හේවගේ පාලිත ප්‍රසන්න ප්‍රනාන්දු ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ (නි/60649)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී,
මේජර් ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2020 අගෝස්තු මස 17 වැනි දින,
කොළඹ දී ය.

09 - 196/1

2021 අංක 685

MOD/DEF/HRM/02/R/RET/20 (175-177).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක්, විශ්‍රාම ගැනීමක් සහ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2019 නොවැම්බර් මස 27 වැනි දින සිට මේජර් ජෙනරාල් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් ජෙනරාල් වීරියවන්ත මුදියන්සේලාගේ ජාලිය රත්න කුමාර සේනාරත්න ආර්ඩබ්පී ආර්එස්පී (නි/60738)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2020 සැප්තැම්බර් මස 03 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජෙනරාල් වීරියවන්ත මුදියන්සේලාගේ ජාලිය රත්න කුමාර සේනාරත්න ආර්ඩබ්පී ආර්එස්පී (නි/60738)

**නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2020 සැප්තැම්බර් මස 03 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජෙනරාල් වීරියවන්ත මුදියන්සේලාගේ ජාලිය රත්න කුමාර සේනාරත්න ආර්ඩබ්පී ආර්එස්පී (නි/60738)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී,
මේජර් ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2020 අගෝස්තු මස 17 වැනි දින,
කොළඹ දී ය.

09 - 196/2

2021 අංක 686

MOD/DEF/HRM/02/R/RET/21 (01-02).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක්, විශ්‍රාම ගැනීමක් සහ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2019 දෙසැම්බර් මස 27 වැනි දින සිට මේජර් ජෙනරාල් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් ජෙනරාල් රත්නායක මුදියන්සේලාගේ ප්‍රියන්ත ජගත් රත්නායක ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී (නි/60749)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2021 මාර්තු මස 22 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජෙනරාල් රත්නායක මුදියන්සේලාගේ ප්‍රියන්ත ජගත් රත්නායක ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී (නි/60749)

**නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2021 මාර්තු මස 22 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජෙනරාල් රත්නායක මුදියන්සේලාගේ ප්‍රියන්ත ජගත් රත්නායක ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී (නි/60749)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, එම්ෆිල්,
ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2021 පෙබරවාරි මස 19 වැනි දින,
කොළඹ දී ය.

09 - 196/3

2021 අංක 687

MOD/DEF/HRM/02/R/RET/20 (175-177).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක්, විශ්‍රාම ගැනීමක් සහ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2020 මැයි මස 22 වැනි දින සිට මේජර් ජෙනරාල් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් ජෙනරාල් නිශ්ශංක ලලිත් කුමාර සමරසිංහ අයිජී (නි/60693)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2020 සැප්තැම්බර් මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජෙනරාල් නිශ්ශංක ලලිත් කුමාර සමරසිංහ අයිජී (නි/60693)

**නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2020 සැප්තැම්බර් මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජෙනරාල් නිශ්ශංක ලලිත් කුමාර සමරසිංහ අයිජී (නි/60693)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී,
මේජර් ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

.

2020 අගෝස්තු මස 17 වැනි දින,
කොළඹ දී ය.

09 - 196/4

2021 අංක 688

MOD/DEF/HRM/02/R/RET/21 (01-02).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක්, විශ්‍රාම ගැනීමක් සහ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2020 නොවැම්බර් මස 30 වැනි දින සිට මේජර් ජෙනරාල් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් ජෙනරාල් මනෝජ් ප්‍රියන්ත ලමාහේවා යූඑස්පී (නි/61121)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2021 පෙබරවාරි මස 23 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජෙනරාල් මනෝජ් ප්‍රියන්ත ලමාහේවා යූඑස්පී (නි/61121)

**නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2021 පෙබරවාරි මස 23 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජෙනරාල් මනෝජ් ප්‍රියන්ත ලමාහේවා යූඑස්පී (නි/61121)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, එම්ෆිල්,
ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2021 පෙබරවාරි මස 19 වැනි දින,
කොළඹ දී ය.

09 - 196/5

2021 අංක 689

MOD/DEF/HRM/02/R/RET/21 (14).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක්, විශ්‍රාම ගැනීමක් සහ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2021 ජනවාරි මස 28 වැනි දින සිට මේජර් ජෙනරාල් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් ජෙනරාල් ගොඩපුස්ස මුදියන්සේලාගේ චිත්‍රලාල් කිත්සිරි බංඩාර ඒකනායක ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී (නි/61065)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2021 පෙබරවාරි මස 28 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජෙනරාල් ගොඩපුස්ස මුදියන්සේලාගේ චිත්‍රලාල් කිත්සිරි බංඩාර ඒකනායක ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී (නි/61065)

**නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2021 පෙබරවාරි මස 28 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජෙනරාල් ගොඩපුස්ස මුදියන්සේලාගේ චිත්‍රලාල් කිත්සිරි බංඩාර ඒකනායක ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී (නි/61065)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, එම්ෆිල්,
ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2021 පෙබරවාරි මස 25 වැනි දින,
කොළඹ දී ය.

09 - 196/6

2021 අංක 690

MOD/DEF/HRM/02/R/RET/21 (10-11).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් සහ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2021 අප්‍රේල් මස 02 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජෙනරාල් කතළුව පටබැඳිගේ සුමිත් ප්‍රේමලාල් ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී (නි/61027)

**නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2021 අප්‍රේල් මස 02 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජෙනරාල් කතළුව පටබැඳිගේ සුමිත් ප්‍රේමලාල් ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී (නි/61027)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, එම්ෆිල්,
ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2021 පෙබරවාරි මස 25 වැනි දින,
කොළඹ දී ය.

09 - 196/7

2021 අංක 691

MOD/DEF/HRM/02/R/RET/21 (10-11).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් සහ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2021 අප්‍රේල් මස 22 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජෙනරාල් කලුහත් වසන්ත රත්නායක ද ආබ්‍රෙව් ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී (නි/60938)

**නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2021 අප්‍රේල් මස 22 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජෙනරාල් කලුහත් වසන්ත රත්නායක ද ආබ්‍රෙව් ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී (නි/60938)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, එම්ෆිල්,
ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2021 පෙබරවාරි මස 25 වැනි දින,
කොළඹ දී ය.

09 - 196/8

2021 අංක 692

MOD/DEF/HRM/02/R/REM/21 (01-05).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැනීම

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2020 නොවැම්බර් මස 04 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කර්නල් වර්ණකුලසූරිය නිකලස් ප්‍රදීප් ශාස්ත්‍රී කුමාර් පෙරේරා ආර්ඩබ්පී ආර්එස්පී (නි/61715)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, එම්ෆිල්,
ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2021 පෙබරවාරි මස 25 වැනි දින,
කොළඹ දී ය.

09 - 196/9

2021 අංක 693

MOD/DEF/HRM/02/R/RES/20 (11-12).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරිණිය 2020 දෙසැම්බර් මස 31 වැනි දින සිට අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් කර්නල් කළුවම්පුර ගෙදර නිල්වලා උමයංගනී ජයසිංහ ශ්‍රීලයුවෛබ (නි/70782)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, එම්ෆිල්,
ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2021 පෙබරවාරි මස 01 වැනි දින,
කොළඹ දී ය.

09 - 196/10

---

2021 අංක 694

MOD/DEF/HRM/02/R/REM/21 (06-07).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2020 අගෝස්තු මස 18 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් ලද්දුසිංහ බදුගේ ඩිල්හාන් වෙනුර ද සිල්වා ආර්ඩබ්පී ආර්එස්පී ගරෙ (නි/65743)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2020 අගෝස්තු මස 19 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ලද්දුසිංහ බදුගේ ඩිල්හාන් වෙනුර ද සිල්වා ආර්ඩබ්පී ආර්එස්පී ගරෙ (නි/65743)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, එම්ෆිල්,
ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2021 පෙබරවාරි මස 11 වැනි දින,
කොළඹ දී ය.

09 - 196/11

---

2021 අංක 695

MOD/DEF/HRM/02/R/REM/21 (06-07).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2020 සැප්තැම්බර් මස 25 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් දේවගිරි මුදියන්සේලාගේ පුබුදු මධුරංග හේරත් විපාරෙ (නි/66883)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2020 සැප්තැම්බර් මස 26 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් දේවගිරි මුදියන්සේලාගේ පුබුදු මධුරංග හේරත් විපාරෙ (නි/66883)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්,
ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2021 පෙබරවාරි මස 11 වැනි දින,
කොළඹ දී ය.

09 - 196/12

2021 අංක 696

MOD/DEF/HRM/02/R/RET/20 (217-219).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2020 අගෝස්තු මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් සූරිය ආරච්චි බංඩාරගේ සමන් විජේවික්‍රම විපාරෙ (නි/66740)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, එම්ෆිල්,
මේජර් ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්‍ෂක අමාත්‍යාංශය..

2020 අගෝස්තු මස 29 වැනි දින,
කොළඹ දී ය.

09 - 196/13

2021 අංක 697

MOD/DEF/HRM/02/R/REM/21 (08-09).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2020 අගෝස්තු මස 26 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් බරනිවල ලියනගේ රෝහන රණවීර ආර්එස්පී, ශ්‍රීලසසබ (නි/67374)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, එම්ෆිල්,
ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්‍ෂක අමාත්‍යාංශය..

2021 පෙබරවාරි මස 19 වැනි දින,
කොළඹ දී ය.

09 - 196/14

2021 අංක 698

MOD/DEF/HRM/02/R/REM/21 (01-05).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2020 සැප්තැම්බර් මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් කෝණාර මුදියන්සේලාගේ උපුල් වීරසිංහ ආර්එස්පී ගැහේබ (නි/66666)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, එම්ෆිල්,
ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්‍ෂක අමාත්‍යාංශය.

2021 පෙබරවාරි මස 25 වැනි දින,
කොළඹ දී ය.

09 - 196/15

2021 අංක 699

MOD/DEF/HRM/02/R/RET/20 (190-191).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2020 සැප්තැම්බර් මස 09 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් ඕමාර දුනුවිලගේ සුසන්ත විජිත කුමාර ගැහේබ (නි/66657)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී,
මේජර් ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2020 අගෝස්තු මස 28 වැනි දින,
කොළඹ දී ය.

09 - 196/16

2021 අංක 700

MOD/DEF/HRM/02/R/REM/21 (01-05).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2020 සැප්තැම්බර් මස 26 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් වලිමුණි දේවයලාගේ රුවන් චන්ද්‍රකුමාර ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී ශ්‍රීලපාහ (නි/67456)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, එම්ෆිල්,
ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2021 පෙබරවාරි මස 25 වැනි දින,
කොළඹ දී ය.

09 - 196/17

2021 අංක 701

MOD/DEF/HRM/02/R/RET/20 (190-191).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2020 නොවැම්බර් මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් අලවලයලාගේ උපාලි රත්නායක ශ්‍රීලසිරෙ (නි/67778)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී,
මේජර් ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2020 අගෝස්තු මස 28 වැනි දින,
කොළඹ දී ය.

09 - 196/18

2021 අංක 702

MOD/DEF/HRM/02/R/REM/21 (08-09).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2020 නොවැම්බර් මස 18 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් ලියන විජේරත්නලාගේ සුනිල් දයාරත්න විපාරෙ (නි/66772)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, එම්ෆිල්,
ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2021 පෙබරවාරි මස 19 වැනි දින,
කොළඹ දී ය.

09 - 196/19

2021 අංක 703

MOD/DEF/HRM/02/R/RET/20 (217-219).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2020 දෙසැම්බර් මස 20 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් අතපත්තු විජේකෝන් මුදියන්සේලාගේ සමන්ත බංඩාර ශ්‍රීලකාහ (නි/67266)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී,
මේජර් ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2020 අගෝස්තු මස 29 වැනි දින,
කොළඹ දී ය.

09 - 196/20

---

2021 අංක 704

MOD/DEF/HRM/02/R/REM/21 (01-05).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2020 සැප්තැම්බර් මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් (උපකරණ පාලක) හිටිහාමුලාගේ ගෙදර ජයසේකර යූඑස්පී ශ්‍රීලංඉ (නි/67565)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, එම්ෆිල්,
ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2021 පෙබරවාරි මස 25 වැනි දින,
කොළඹ දී ය.

09 - 196/21

2021 අංක 705

MOD/DEF/HRM/02/R/REC/21 (02).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

**නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2020 දෙසැම්බර් මස 20 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් (උපකරණ පාලක) හේරත් මුදියන්සේලාගේ අනුර රුවන් බණ්ඩාර හේරත් යූඑස්පී ගරෙ (නි/69390)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, එම්ෆිල්,
ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2021 පෙබරවාරි මස 23 වැනි දින,
කොළඹ දී ය.

09 - 196/22

---

2021 අංක 706

MOD/DEF/HRM/02/R/RET/20 (217-219).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2020 දෙසැම්බර් මස 20 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් (උපකරණ පාලක) හේරත් මුදියන්සේලාගේ අනුර රුවන් බණ්ඩාර හේරත් යූඑස්පී ගරෙ (නි/69390)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී,
මේජර් ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2020 අගෝස්තු මස 29 වැනි දින,
කොළඹ දී ය.

09 - 196/23

2021 අංක 707

MOD/DEF/HRM/02/R/RET/21 (16).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2021 මාර්තු මස 15 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් (උපකරණ පාලක) පහල ගෙදර වත්නි ආරච්චිගේ චන්ද්‍රපාල යූඑස්පී ශ්‍රීලංඉබ (නි/69827)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, එම්ෆිල්,
ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2021 මාර්තු මස 11 වැනි දින,
කොළඹ දී ය.

09 - 196/24

2021 අංක 708

MOD/DEF/HRM/02/R/REM/21 (01-05).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2020 ජූලි මස 25 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් (උපකරණ පාලක) හේරත් මුදියන්සේලාගේ හේරත් බංඩාගේ සමන්ත රාජපක්ෂ හේරත් ආර්එස්පී යූඑස්පී කරෙ (නි/70195

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, එම්ෆිල්,
ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2021 පෙබරවාරි මස 25 වැනි දින,
කොළඹ දී ය.

09 - 196/25

---

2021 අංක 709

MOD/DEF/HRM/02/R/RES/20 (11-12).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරි 2021 ජනවාරි මස 09 වැනි දින සිට අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

දෙවන ලුතිනන් මහමරක්කලගේ කවිදු අශාන් පෙරේරා ශ්‍රීලයුයුබ (නි/71203)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, එම්ෆිල්,
ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2021 පෙබරවාරි මස 01 වැනි දින,
කොළඹ දී ය.

09 - 196/26

# වෙනත් පත්කිරීම් ආදිය

## ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය

### නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවය සංශෝධනය කිරීමක්

**2018 අගෝස්තු මස 31 වැනි දින පළවූ ගැසට් නිවේදනය අනුව**

*2018 ජනවාරි මස 17 වැනි දින සිට උප ලුතිනන් (සැ) වශයෙන් :*

උප ලුතිනන් (සැ) රණසිංහ මුදියන්සේලාගේ අරාවේගෙදර සමින්ද ප්‍රමෝද් රණසිංහ, එන්ආර්එස් 3629, ශ්‍රීලංනාහ

*2018 මාර්තු 18 වැනි දින සිට උප ලුතිනන් වශයෙන් :*

උප ලුතිනන් වට්ටෝරු ගෙදර පැතුම් භාරත තිලකරත්න, එන්ආර්එක්ස් 3604, ශ්‍රීලංනාහ වශයෙන් සංශෝධනය කරනු ලැබේ.

**2020 ඔක්තෝබර් මස 02 වැනි දින පළවූ ගැසට් නිවේදනය අනුව**

*2018 ජූලි මස 30 වැනි දින සිට උප ලුතිනන් වශයෙන් :*

උප ලුතිනන් ගොඩගේලාගේ ප්‍රනීත් මදාර ධර්මසේන, එන්ආර්එක්ස් 3727, ශ්‍රීලංනාහ වශයෙන් සංශෝධනය කරනු ලැබේ.

ඩීඑන්එස් උළුගේතැන්න,
ආර්එස්පී*, වීඑස්වී, යූඑස්පී, එන්ඩීසී, පීඑස්සී,
වයිස් අද්මිරාල්,
නාවික හමුදාධිපති

2021 අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දී ය.

09 - 173

# රජයේ නිවේදන

## ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - ඉඹුල්පෙ

### උග්ගල් අලුත්නුවර කතරගම දේවාලයේ වාර්ෂික මහ පෙරහැර - 2021

*පෙරහැර පවත්වන කාල සීමාව :*

1. 2021 වසරේ ඇසළ පෙරහැර සඳහා කප් සිටුවීම 2021.08.09 වැනි දින සුබ මොහොතින් සිදු කරන ලදී.
   * 2021.10.05 වැනි දින සර්ව රාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනාව ද,
   * 2021.10.06 වැනි දින සිට 2021.10.10 වැනි දින දක්වා උඩමළුවේ පෙරහැරද,
   * 2021.10.11 වැනි දින සිට 2021.10.15 වැනි දින දක්වා දෙවෙලේ පෙරහැරද,
   * 2021.10.16 වැනි දින සිට 2021.10.20 වැනි දින දක්වා මහා පෙරහැරද,
   * 2021.10.21 වැනි දින සිට උදෑසන යෙදෙන සුබ මොහොතින් දිය කැපීමේ මංගල්‍යයෙන් අනතුරුව පෙරහැර ගෙවදීමෙන් ඇසළ පෙරහැර මංගල්‍යය නිමා කිරීමට නියමිතය.

*කඳවුරු ප්‍රදේශය යනු :*

2. දේවාල භූමියේ උඩ වීදිය, නැගෙනහිර පෙදෙස හා බටහිර පෙදෙස වන පිරිත්වත්ත, ගල්වත්ත, මළුකාරවත්ත හා උතුරු දෙසින් පිහිටි උඩහගෙදරවත්ත යන සීමාවන්ට මැදිව පිහිටි භූමිභාගය පෙරහැර පවත්වන කඳවුරු ප්‍රදේශය වේ.

*ආහාර හා ජලය*

3. විහාර මළුව, බෝ මළුව, චෛත්‍යය මළුව. දේවාලය අවට පහත මාලය, කලායතන රථගෙය, මැදවත්ත හා ඒ අවට ප්‍රදේශ තුළ ආහාර පිසීම තහනම් කෙරේ.

4. අලි ඇතුන් ගාල් කර ඇති ස්ථානවල නිකරුණේ ගැවසීම නොකළ යුතු අතර අවසරලත් අයහැර සතුනට ආහාර සැපයීම නොකළ යුතුය.

5. පෙරහැර පැවැත්වෙන කාල සීමාව තුළ අවශ්‍ය පානීය ජලය හා අමතර ජල ටැංකි යොදා පහසුකම් සැපයීම ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලයට හා ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට පවරමි.

*වෙළෙඳාම හා ගොඩනැගිලි ඉදිකිරීම්:*

6. දේවාල උඩ මළුව, මැද වීදිය, මළුවට පිවිසෙන මාර්ගය හා ඒ දෙපස ප්‍රදේශ තුළ මල්, සුවඳ ද්‍රව්‍ය, ඉටිපන්දම් හා භාර සඳහා අවශ්‍ය පූජා භාණ්ඩ විකිණීම සපුරා තහනම්ය.

7. ඉහත අංක 02 වගන්තියෙහි සඳහන් භූමිය තුළ හෝ වෙනත් කිසිම ස්ථානයක වෙළෙඳාම් කිරීම හා මුදල් උපයන කිසිදු ක්‍රියාවක් නොකළ යුතුය.

8. පෙරහැර මංගල්‍යය පවත්වන දිනවල, සාමාන්‍යයෙන් පවත්වාගෙන යනු ලබන මවිසින් ලියාපදිංචි කර ඇති ස්ථිර වෙළෙඳසැල්වල හැර අනෙකුත් වෙළෙඳාම් කටයුතු සිදු කිරීම තහනම්ය.

9. ප්‍රාදේශීය ලේකම්ගේ බලයලත් නිලධාරියෙකුගේ අනුමැතියක් නොමැතිව කිසියම් තැනැත්තෙකු විසින් කඳවුරු ප්‍රදේශය තුළ ටිකට්පත්, කොඩි විකිණීම හෝ වෙනත් අන්දමක කුමන කාර්යයක් සඳහා හෝ මුදල් එකතු කිරීම නොකළ යුතු අතර, පෙරහැර පවත්වන කාල සීමාව තුළ එම භූමියේ සහ ඒ අවට දේවාල සීමාව තුළ දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන හා සියලුම මත් ද්‍රව්‍ය විකිණීම හා භාවිත කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

10. මාගෙන් ලබා ගත් අවසරයක් නොමැතිව කඳවුරු ප්‍රදේශයේ කිසිදු ගොඩනැගිල්ලක් ඉදි කිරීම හා අනවසර වෙළෙඳාම් කටයුතු තහනම් වන අතර, එසේ කටයුතු/ඉදි කිරීම් සෞඛ්‍ය අංශවල නිර්දේශවලට අනුව පොලිසිය විසින් ඉවත් කරනු ලැබේ.

*වාහන :*

11. පෙරහැර පැවැත්වෙන කාලසීමාව තුළ උත්සව භූමියට වාහන ඇතුළු කිරීමට ඉඩ දෙනු ලබන්නේ ඇසළ උත්සවය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර ඇති වාහනවලට පමණි. ඒ අනුව පහත සඳහන් මාර්ගවල වාහන ගමනාගමනයට ඉඩදෙනු නොලැබේ.

* කොළඹ බදුල්ල ප්‍රධාන මාර්ගයෙන් අලුත්නුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාල මංසන්ධියෙන් දේවාල භූමියට පිවිසෙන මාර්ගය.
* තොටපල්ල, පොකුණේගම ප්‍රදේශයෙන් දේවාල භූමියට පිවිසෙන මාර්ගය.
* පිරිත්වත්ත, ගල්වත්ත ප්‍රදේශයෙන් දේවාල භූමියට පිවිසෙන මාර්ගය.

12. ප්‍රධාන මාර්ගයේ පෞද්ගලික වාහන නතර කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කරමි. බයිසිකල් හා කරත්ත ඇතුළුව සියලුම රථ වාහන මාර්ග හෝ කඳවුරු භාර නිලධාරි තැනගේ බලපතක් නොමැතිව කඳවුරු භූමිය තුළට ඇතුළු කිරීම තහනම්ය.

*ඡායාරූප ගැනීම :*

13. දේවාලයේ දික් ගෙය, මාළිගාවේ ඉහළ මාලය, ඡායාරූප ගැනීම හා රූගත කිරීම අනුමැතියකින් තොරව සිදු කිරීම සපුරා තහනම් කෙරේ.

*විදුලිය පහසුකම් :*

14. දේවාල භූමිය හා අවට මාර්ගයේ වීදි ලාම්පු හා අමතර ලාම්පු සවි කිරීම ලංකා විදුලිබල මණ්ඩලයට හා ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට පවරමි.

*සෞඛ්‍ය පහසුකම් :*

15. පෙරහැර මංගල්‍යයට පෙර හා පසු සෞඛ්‍ය කටයුතු, සනීපාරක්ෂක කටයුතු, ඩෙංගු මර්දන කටයුතු හා අපද්‍රව්‍ය ඉවත් කිරීම ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට හා සබරගමුව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට පවරමි.

16. යම් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන කිසිම තැනැත්තෙක් කඳවුරු පෙදෙස තුළට ඇතුළත් නොවිය යුතු අතර, රට තුළ බලපවත්වන වර්තමාන සෞඛ්‍ය උපදෙස්වලට, විශේෂයෙන්ම කොවිඩ් - 19 වසංගත තත්ත්වයට අදාළ සෞඛ්‍යාරක්ෂිත මාර්ගෝපදේශවලට අනුකූලව ක්‍රියා කිරීමට තරයේ වග බලාගත යුතුය.

*යාචකයෝ :*

17. සිඟමන් යැදීම හා පිනට ඉල්ලා ගැනීම සඳහා පූජා භූමිය තුළ හෝ කඳවුරු පෙදෙස තුළ මුදලින් හෝ යම් වෙනත් ආකාරයකින් හෝ කිසිම තැනැත්තෙකු විසින් පිනට යමක් දීම හෝ පිනට යමක් බෙදා හැරීමට හෝ අවසර නොමැත.

*ආරක්ෂාව :*

18. සියලු ආරක්ෂක කටයුතු, පෙරහැරට අවහිර නොවන ලෙස මාර්ගයේ රථවාහන හැසිරවීම ආරක්ෂක අංශ හා පොලීසිය වෙත පවරමි.

*වෙනත් :*

19. රතිඤ්ඤා, වෙඩි ආදිය ප්‍රදේශය තුළ පත්තු කිරීම තහනම්ය.

20. පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය මත මෙවර පෙරහැර මංගල්‍යය චාරිත්‍රානුකූලව පමණක් සිදු කෙරේ.

ඩී. පී. ජී. රේණුකා,
ප්‍රාදේශීය ලේකම්,
ඉඹුල්පෙ.

09 - 179

**ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - ඉඹුල්පෙ**

බොල්තුඹේ සමන් දේවාලයේ වාර්ෂික මහ පෙරහැර - 2021

*පෙරහැර පවත්වන කාල සීමාව :*

1. 2021 වසරේ ඇසළ පෙරහැර සඳහා කප් සිටුවීම 2021.07.18 වැනි දින සුබ මොහොතින් සිදු කරන ලදී.

* 2021.10.05 වැනි දින සර්ව රාත්‍රික පිරිත් දේශනාව හා පසුදින උදෑසන හීල් දානය පිරි නැමීම ද,
* 2021.10.06 වැනි දින උඩමළුවේ පෙරහැර ද,
* 2021.10.16 වැනි දින මහ පෙරහැර ද,
* 2021.10.21 වැනි දින වලහුන් ඇල්ල මූකලාන දිය උල්පතේදී දිය කැපීමේ මංගල්‍යයෙන් අනතුරුව පෙරහැර ගෙවදීමෙන් ඇසළ පෙරහැර මංගල්‍යය නිමා කිරීමට නියමිතය.

*කඳවුරු ප්‍රදේශය යනු :*

2. දේවාලයේ උතුරට : පාර එම්. කේ. ලුවිස් සිංඤෝ, එම්. කේ. පොඩි මහත්තයා යන අයගේ ඉඩමද, නැගෙනහිරට : සිරිනිමල් හා එම්. කේ. විජේදාස යන අයගේ ඉඩම් ද, දකුණට : රංබණ්ඩාර මහතාගේ ගල්පඩිවත්ත යන ඉඩමද, බස්නාහිරට : බී. එම්. විජේහාමි හා නෝබට් චින්තාමණී යන අයගේ ඉඩම්ද මායිම්ව පිහිටි භූමි භාගය පෙරහැර පවත්වන කඳවුරු ප්‍රදේශය වේ.

*ආහාර හා ජලය :*

3. විහාර මළුව, බෝධි මළුව හා දේවාල භූමිය යන ස්ථාන අවට භූමි භාගවල ආහාර පිසීම තහනම් කරමි.

*වෙළඳාම :*

4. උඩ මළුව තුළ, දඩු හැල තුළ, චෛත්‍යය මළුව තුළ, රථයේ මළුව හා විහාර මළුව තුළ සියලු වෙළඳාම් තහනම් කරමි.

5. පහළ වීදියේ දකුණු පැත්තට ප්‍රධාන ගල්පඩි පෙළ සිට සිංහාසන මන්දිරය දක්වා ගල්පඩි පෙළ නැගෙනහිර පැත්තෙන් නැටුම් කාමරය දක්වා පහළ වීදියේ දේවාලය දෙසට වන්නට රථගේ මළුව බැම්ම සිට චෛත්‍ය කොටස දක්වාද මා විසින් නියම කරන ලද භූමිය ද නැවත රථගෙයි මළුවට නැගෙනහිරින් හා දකුණින් පහළ කොටස ද රථගෙයි ඉදිරිපසින් දේවාලයට නැගෙනහිර සීමාවට ආසන්නව ද සියලු ආකාරයේ සාමාන්‍යයෙන් පවත්වාගෙන යනු ලබන, මවිසින් ලියාපදිංචි කර ඇති ස්ථිර වෙළෙඳසැල්වල හැර අනෙකුත් වෙළඳාම් කටයුතු සිදු කිරීම තහනම්ය.

6. ප්‍රාදේශීය ලේකම්ගේ බලයලත් නිලධාරියෙකුගේ අනුමැතියක් නොමැතිව කිසියම් තැනැත්තෙකු විසින් කඳවුරු ප්‍රදේශය තුළ ටිකට්පත්, කොඩි විකිණීම හෝ වෙනත් අන්දමක කුමන කාර්යයක් සඳහා හෝ මුදල් එකතු කිරීම නොකළ යුතු අතර, පෙරහැර පවත්වන කාල සීමාව තුළ එම භූමියේ සහ ඒ අවට දේවාල සීමාව තුළ දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන හා සියලුම මත් ද්‍රව්‍ය විකිණීම හා භාවිතා කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

*වාහන :*

7. ප්‍රධාන මාර්ගයේ පෞද්ගලික වාහන නතර කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කරමි. බයිසිකල් හා කරත්ත ඇතුළුව සියලුම රථ වාහන මාර්ග හෝ කඳවුරු භාර නිලධාරි තැනගේ බලපතක් නොමැතිව කඳවුරු භූමිය තුළට ඇතුළු කිරීම තහනම්ය.

*සෞඛ්‍ය :*

8. යම් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන කිසිම තැනැත්තෙක් කඳවුරු පෙදෙස තුළට ඇතුළත් නොවිය යුතු අතර, රට තුළ බලපවත්වන වර්තමාන සෞඛ්‍ය උපදෙස්වලට, විශේෂයෙන්ම කොවිඩ් - 19 වසංගත තත්ත්වයට අදාළ සෞඛ්‍යාරක්ෂිත මාර්ගෝපදේශවලට අනුකූලව ක්‍රියා කිරීමට තරයේ වග බලාගත යුතුය.

*ගොඩනැගිලි ඉදි කිරීම :*

9. මා ගෙන් ලබා ගත් අවසරයක් නොමැතිව කඳවුරු ප්‍රදේශයේ කිසිදු ගොඩනැගිල්ලක් ඉදි කිරීම හා අනවසර වෙළඳාම් කටයුතු තහනම් වන අතර, එසේ කටයුතු/ඉදිකිරීම් සෞඛ්‍ය අංශවල නිර්දේශවලට අනුව පොලීසිය විසින් ඉවත් කරනු ලැබේ.

*යාචකයෝ :*

10. සිඟමන් යැදීම හෝ පිනට ඉල්ලා ගැනීම සඳහා පූජා භූමිය තුළ හෝ කඳවුරු පෙදෙස තුළ මුදලින් හෝ යම් වෙනත් ආකාරයකින් හෝ කිසිම තැනැත්තෙකු විසින් පිනට යමක් දීම හෝ පිනට යමක් බෙදා හැරීමට හෝ අවසර නොමැත.

11. පවතින කොවිඩ් 19 වසංගත තත්වය මත මෙවර පෙරහැර මංගල්‍යය චාරිත්‍රානුකූලව පමණක් සිදු කෙරේ.

ඩී.ජී. බී. රේණුකා,
ප්‍රාදේශීය ලේකම්,
ඉඹුල්පේ.

09 - 180

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

රෝහල් කොට්ඨාස ප්‍රතිශෝධනය කිරීමේ දැන්වීම

**සංශෝධනය කිරීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2021.07.22 දිනැති අංක 2238 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද මාතෘ රෝහල, කරාපිටිය අයත් උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය හා රෝහල් කොට්ඨාසයේ නම පහත පරිදි සංශෝධනය කරමි.

"ගාල්ල දිස්ත්‍රික්කයේ, බෝපේ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් උප්පැන්න මරණ කොට්ඨාසය උළුවිටිකේ කොට්ඨාසය ලෙස හා රෝහල් කොට්ඨාසයේ නම කරාපිටිය මාතෘ රෝහල ලෙසත් සංශෝධනය විය යුතුය."

2021 සැප්තැම්බර් මස 24 වැනි දින සිට මෙම නිවේදනය ක්‍රියාත්මක වේ.

චමල් රාජපක්ෂ,
වාරිමාර්ග අමාත්‍ය හා රාජ්‍ය ආරක්ෂක හා
ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍ය.

2021 අගෝස්තු මස 28 වැනි දින,
කොළඹ දී ය.

09 - 207

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.